# උතුරෙන් නැගෙනහිර වෙන්කිරීම තහවුරු වෙයි

නැගෙනහිර පළාත්සභා ඡන්දය කොටි බෝම්බ, මෝටාර් මධ්‍යයෙහි පැවැත්වීමෙන් පසුව ද එ ජා ප - මු කො හවුලට දිනාගැනීමට නො හැකිවිය. කොටි අම්පාරේ බෝම්බ පුපුරුවා, මඩකලපුවේ පිල්ලියාන් කණ්ඩායමේ ආධාරකරුවන් මරා දමා, මෝටාර් ගසා තැත්කෙළේ සන්ධානයට පක්ෂ ජනතාව බියගන්වා ඡන්ද පොළෙන් ඈත්කර තැබීම ය. එහෙත් ඒ සියල්ල මැද එ ජා ප - මු කො හවුල කතාකරන්නේ සන්ධානයේ බිය වැද්දීම්, භීෂණ, අඩත්තේට්ටම් ආදිය නිසා තමන්ට ජයගැනීමට නොහැකිවූ බව ය. මෙය මැතිවරණයකින් පසුව පරාජිත පක්ෂය ජයග්‍රාහකයන්ගේ දූෂණ හා වෙනත් අක්‍රමිකතා ගැන චෝදනාකළ පළමු වතාව හෝ අවසාන වතාව හෝ නො වෙයි. මේ මැතිවරණයේ දී යම් යම් සිද්ධි ඇතිවී තිබෙන බව පැහැදිලි ය. එහෙත් ලැබෙන තොරතුරුවලින් හෙළිවන්නේ වෙනත් බොහෝ මැතිවරණ සමග සැසඳීමේ දී නැගෙනහිර පළාත්සභා මැතිවරණය සාමහාමී බව ය. කොටින්ගේ මිනීමැරුම් නොවන්නට මේ මැතිවරණය දශක කිහිපයකින් පැවැත්වූ වඩාත් ම සාමකාමී මැතිවරණය ලෙස හැඳින්වීමට තිබුණි.

නැගෙනහිර පළාත්සභා මැතිවරණයේ වැදගත් ලක්ෂණයක් වුයේ එ ජා ප නාමයෝජනා පත්‍ර භාරදුන් දිනයේ සිට ම පරාජය දැන දැන ආදෝනා කීමට පටන්ගැනීම ය. මැතිවරණ දූෂණ ගැන එ ජා ප කරුණුකීමට පටන්ගත්තේ නාමයෝජනා පත්‍ර භාරදුන් දිනයේ ය. මු කො නොවන්නට එ ජා පක්ෂයට නැගෙනහිර මැතිවරණ ව්‍යාපාරයක් නො වී ය. සිරිකොත මධ්‍යස්ථානය කරගත් ඊනියා මැතිවරණ නිරීක්ෂක කණ්ඩායමක හා ලක්ෂමන් කිරිඇල්ල මහතාගේ අදෝනා හැරුණු විට එ ජා පක්ෂයට වෙනත් දෙයක් කීමට නො තිබුණි. ඇතැමුන්ට අනුව මෙය රනිල් වික්‍රමසිංහ මහතාගේ පහළොස්වැනි පරාජය ය. එහෙත් මේ දිගින් දිගට ම පරදින්නේ එ ජා පක්ෂය මිස වික්‍රමසිංහ මහතා පමණක් නොවන බව තේරුම්ගත යුතු ය.

රනිල් වික්‍රමසිංහ මහතා හැරුණුවිට  වෙනත් අයකු පක්ෂ නායකයා වී නම් ඒ ලැබෙන්නේත් පරාජයක් මිස ජයක් නො වේ. තවත් අවුරුදු ගණනක් එ ජා පක්ෂයට වික්‍රමසිංහ මහතා නායකත්වයේ තබාගත හැකි ය. ඒ වෙනත් නායකයකු යටතේත් ජයක් බලාපොරොත්තු විය නොහැකි බැවිනි. එ ජා පක්ෂයට ජයගැනීමට නම් ඒ පක්ෂය මෙරට ජාතිකත්වය සමග බද්ධවිය යුතු ය. එහෙත් ඒ බව අවබෝධකරගත් නායකයකු තවමත් එ ජා පක්ෂයට ලැබී නැත. අනෙක් අතට ජාතිකත්වය සමග අනන්‍ය වූ එ ජා ප තවදුරටත් එ ජා පක්ෂය නො වේ.

නැගෙනහිර පළාත්සභා මැතිවරණයෙන් බොහෝ දේ කියැවී ඇත. නැගෙනහිර ජනතාවගේ තීරණය ඓතිහාසික තීරණයකි. මුළු රටක් වෙනුවෙන් තීරණයක් ගැනීමට පළාතකට හෝ දිස්ත්‍රික්කයකට අවස්ථාව උදාවන්නේ ඉතා කලාතුරකිනි. නැගෙනහිර ජනතාවට ඒ වරම මෙවර හිමිවිය. අප පසුගිය සතියේ කියා සිටියේ නැගෙනහිර තීරණය අවුරුදු තිහකට රටට බලපාන බව ය. යම් හෙයකින් එ ජා ප - මු කො හවුල ජයග්‍රහණය කෙළේ නම් රට අවුරුදු තිහකින් ආපස්සට යෑමට තිබුණි. එය ඒ පක්ෂ දෙකෙහි හවුලක් පමණක් නො වී ය. බොහෝ දෙනා පෙන්වා දී තිබූ පරිදි එය අලි කොටි ගස් හවුලක් විය. එපමණක් නො වේ. ඒ පසුපස සියළු විජාතික බලවේග පෙළගැසී සිටියේ ය. මෙරට බටහිර රටවල තානාපතිවරු ඒ ඒ රටවල ඔවුන්ගේ නායකයෝ එ ජා ප - මු කො හවුල දිනන තුරු බලාසිටියහ. ඒ අන්කිසිවකට නොව කොටින්ට ආපසු නැගෙනහිර පළාත භාරදීමට ය.

පරාජිත මානසිකත්වයකින් පෙළෙන එ ජා පක්ෂයට මෙන් නොව මුස්ලිම් කොංග්‍රසයට ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තුවක් විය. හකීම් මහතා තරග කෙළේ මහා ඇමති වීමට ය. ඒ මහතාට ඒ පිළිබඳ යම් විශ්වාසයක් විය. තම ආරක්ෂක සේවය ද අහිමි කරගනිමින් ඒ මහතා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් අස්වූයේ මහත් බලාපොරොත්තු සහගතව ය. මඩකලපු පළාත්පාලන ආයතන ඡන්දයේ දී ද ආසන කිහිපයක් දිනාගැනීමට හැකි වූ මුස්ලිම් කොංග්‍රසය සමස්ත නැගෙනහිර පළාතෙන් ම ජයග්‍රහණයක් බලාපොරොත්තු වීම පුදුමයට කරුණක් නො වේ. හැරත් හකීම් මහතා ප්‍රභාකරන් සමග යම් සම්මුතියකට ද එළඹී  සිටියේ ය. ලංකාවේ පමණක් නොව ලොවේ සියළුම මුස්ලිම් නායකයන් ගත්කල හකීම් මහතා බටහිරයන්ගේ සුවච කීකරු සේවකයෙකි. අද බටහිර යුදෙව් ක්‍රිස්තියානි නූතනත්වය වඩාත් ම විරුද්ධ මුස්ලිම් සංස්කෘතියට ය. සැමුවෙල් හන්ටින්ග්ටන් මහතා සභ්‍යත්ව ගැටුම නම් පොත ලියුවේ අපට ආදරයට නොව සොවියට් රුසියාව බිඳ වැටීමෙන් උද්දාමයට පත්ව සිටි බටහිරයන්ට තමන්ට ඇති

© Prof. Nalin De Silva

තර්ජන හඳුන්වාදීමට බව අපි ඒ දිනවල ම සඳහන්කෙළෙමු. හංටින්ටන්ලාට අනුව ථෙරවාද බෞද්ධ සභ්‍යත්වයක්වත් නැත. එහෙත් බටහිරයන් ඉවෙන් දන්නා කරුණක් නම් ඔවුන්ට ථෙරවාද බෞද්ධ සංස්කෘතීන්ගෙන් ද තර්ජනයක් ඇති බව ය. ඒ ආර්ථික හෝ යුදමය හෝ වශයෙන් නොව සංස්කෘතික වශයෙනි. වඩාත් පැහැදිලිව කිවහොත් ඥානවිභාගාත්මක ව (එපිස්ටොමොලොපිකලි) හා සත්භාවාත්මකව (ඔන්ටොලොපිකලි) ය.

මෙහි දී කිවයුතු කරුණු දෙකක් වෙයි. පළමුවෙන් ම පෙරදිග බොහෝ සංස්කෘතීන්වල ඥානවිභාගය හා සත්භාවය යන්න එකිනෙකින් වෙන් නො කෙරෙයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම හා ශූන්‍ය (මහායානික ශූන්‍යතාව නොවේ) ගැන දේශනාකරන ථෙරවාදය බටහිරයන්ට ප්‍රබල තර්ජනයක් වෙයි. ක්වොන්ටම් අංශුව තේරුම් ගත හැක්කේ අනාත්ම ඇසුරෙන් ය. දෙවැන්න සභ්‍යත්වය (සිවිලිසේෂන්) යන්න හංටින්ටන් මහතා හා වෙනත් බටහිරයන් යොදාගත්ත ද ඒ එතරම් හොඳ සංකල්පයක් නොවන බව ය. සභ්‍යත්වය යන්න බටහිරයන් යොදාගන්නේ මිනිසුන් වර්ගීකරණයෙහි දී බෙදිය හැකි පළල්ම කණ්ඩායම (කුලකය) හැඳින්වීම සඳහා ය. සභ්‍යත්වයක් විසින් ජාතියක් නිර්මාණය කෙරෙන්නේය යන්න නිරවුල් අදහසක් නො වෙයි. සභ්‍යත්වයකට නිර්මාණය කළහැක්කේ එක් ජාතියක් ද? එසේ නම් විවිධ ජාතීහු විවිධ සභ්‍යත්ව වලට අයත්වෙත් ද? හංටින්ටන් හෝ එරික් ෆ්‍රොම් හෝ සභ්‍යත්වය හෝ සමාජ චිත්තය ආදී සංකල්ප ඔස්සේ පැහැදිලි අදහසක් ගෙන ඒමට අසමත් වෙයි. ගුණදාස අමරසේකර මහතා ද පසුගියදා සඳහන්කර තිබුණේ හංටින්ටන් සභ්‍යත්ව ගැටුම ගැන කතාකරන්නේ අපට ආදරයකින් නොවන බව ය. දශකයකට වැඩි කාලයක විශේෂිත වූ අරුතකින් චින්තනය යන්න සමාජයෙහි යොදාගැනෙන්නේ නිරවුල් අදහසක් කීමට ය. චින්තනය, යන්නෙන් අප අදහස්කරන්නේ කුමක් ද යන්න මගේ ලෝකයෙහි සඳහන්කෙරී ඇත. යම් සංස්කෘතියක කලාව, විද්‍යාව, දර්ශනය (මේ ඊනියා සභ්‍යත්ව විඥානයකින් ගොඩ නැගෙන්නක් නොවන අතර සභ්‍යත්ව විඥානයක් යනු ඊනියා සභ්‍යත්වයකින් ජනතාවට හිමිකර දෙනු ලබන්නක් නො වෙයි)., කලාව, සංගීතය, ඇඳුම් පැලඳුම් , සාහිත්‍යය ආදී මෙකී නොකී සියල්ල හුයකින් මෙන් බැඳ තැබෙන්නේ චින්තනය විසිනි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඊනියා යථාර්ථවාදයක් විද්‍යාවෙහි, දර්ශනයෙහි හෝ සාහිත්‍යයෙහි හෝ තිබිය නො හැකි ය.

ඒ කෙසේ වෙතත් බටහිරයන්ගෙන් මුස්ලිම් සංස්කෘතියට තර්ජනයක් තිබියදීත් ලංකාවේ මුස්ලිම් ජනයා බටහිර ගැති එ ජා ප, මු කොංග්‍රසය ආදී පක්ෂ හා අනන්‍යවීම තරමක ප්‍රශ්නයකි. නැගෙනහිර පළාත් සභා මැතිවරණයේ දී මුස්ලිම් ඡන්ද වැඩි ප්‍රමාණයක් එ ජා ප - මු කො හවුලට ලැබී ඇත. පසුගිය ජනාධිපතිවරණයේ දී මඩකලපුවේ දෙමළ ඡන්ද බහුතරය ලැබුණේ රනිල් වික්‍රමසිංහ මහතාට ය. මෙවර ඒ බහුතර දෙමළ ඡන්ද පිල්ලියාන්ට ලැබී ඇත. සන්ධානයට ලැබුණු සිංහල ඡන්ද ද ප්‍රතිශතයක් ලෙස මෙවර වැඩි වී ඇත. එහෙත් මුස්ලිම් ඡන්ද එලෙස වෙනස් වී නැත. මෙයට හේතුව කුමක් ද? නැගෙනහිර පළාතේ ජනයා කොටස් හතරකට බෙදිය හැකි ය. ඒ සිංහල, උතුරේ දෙමළ, නැගෙනහිර දෙමළ හා මුස්ලිම් යනුවෙනි. උතුරේ දෙමළ හා නැගෙනහිර දෙමළ ජනයා සම්භවය අතින් මෙන් ම සංස්කෘතිකව ද වෙනස් වෙති. හැත්තෑවේ දශකයේ මුල්භාගයේ ද ඔවුහු වෙන වෙන ම ජීවත්වූහ. අෂ්රොෆ් මහතා ද සහභාගි වූ 1976 කුප්‍රසිද්ධ වඩුක්කොඩ සම්මේලනයේ දී චෙල්වනායගම් මහතා ඒ කොටස් හතර ඊනියා දෙමළ කතාකරන ජනයා ලෙස එක්කර උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් බිහිකිරීමේ යෝජනාව සම්මතකර ගත්තේ ය. පසුගිය තිස්වසරෙහි උත්සන්න වී පසුව බැසයෑමට පටන්ගත් මේ ප්‍රවනතාව පසුගිය 10වැනි දා දෙමළ ජනයා විසින් බිඳ දමන ලදී. නැගෙනහිර දෙමළ ජනයා වීරෝධාර හමුදාවල ජයග්‍රහණ තහවුරුකරමින් උතුරෙන් වෙන්වීමට එදින තීරණය කළහ. මේ ඓතිහාසික තීන්දුව ගත් නැගෙනහිර දෙමළ ජනයාට අපේ ප්‍රශංසාව හිමිවිය යුතු ය. එහෙත් මුස්ලිම් ජනයා වෙනස් වී නැත. අෂ්රොෆ් මහතා දෙමළ රාජ්‍යයක සුළුතරයකගේ නොගැවුණු මුස්ලිම් කලාපයක් ඇතිකිරීමේ ජාතිවාදී ස්ථාවරයෙහි පිහිටියේ ය. මේ සම්පූර්ණයෙන් ම මෙරට ඉතිහාසයට හා සම්ප්‍රදායට වෙනස් වෙයි. ශ්‍රී ල නි පක්ෂයට මුස්ලිම් ජනයාගෙන් බහුතරයක් දිනාගත නොහැකි වී ඇත්තේ ඇයි? හිස්බුල්ලලාට, අතාවුල්ලලාට පමණක් නොව ඉරාන ජනාධිපතිතුමා ට ද, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ද මුස්ලිම් ජනයාගේ සැලකියයුතු ආකර්ෂණයක් නැත. ශ්‍රී ල නි පක්ෂයේ මුස්ලිමුන් නියෝජනයකරන්නේ මුස්ලිම් ජනයා නොවේ. ඔවුන් මැතිවරණ දිනන්නේ කඩුගන්නාවේ සිංහල මරික්කාර් මෙන් සිංහල ඡන්දවලිනි. මුස්ලිම් ජනයා බටහිර ඒජන්තයන්ගෙන් කඩන්නේ කෙසේ ද යන්නට ශ්‍රී ල නි පක්ෂය පිළිතුරක් සපයන්නේ නම් රණවිරුවන්ගේ වීරෝදාර ක්‍රියා තහවුරුකරමින් උතුරෙන් වෙන්වීමට නැගෙනහිර ජනතාව ගත් තීරණය තවත් පියවරකින් ඉදිරියට යනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva